# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### කුඩා වැව් සඳහා ජලය සැපයීමට සහ කාර්ය මණ්ඩලයේ හා උද්‍යානය නැරඹීමට පැමිණෙන්නන්ගේ පාවිච්චිය සඳහා යාල උද්‍යානයේ පී.වී.සී. ජලනළ (4") එළීම - 1 අදියර (කි.මී. 9)

**කොන්ත්‍රාත් අංක : LK-ESCAMP-DWC-117577-CW-RFB**

01. බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො. 82, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ESCAMP ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කාර්යන් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 53.98 ක් (ආපාතික සහ VAT රහිතව) වන අතර සම්පූර්ණ කාර්ය නිම කිරීමට ඇති කාලය දින 120 කි. ප්‍රමාණ බිල්පත්වලට අනුව (BOQ) අගල් කැණීම්, පී.වී.සී. ජල නළ එළීම, මැන් හෝල් සැකසීම, අගල් නැවත පිරවීම මෙහි කාර්යයන් ලෙස පවතී.

02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධුලේඛනගත නොවී සිටිය යුතු අතර, ජල සහ ජලාපවාහන ක්ෂේත්‍රයේ CIDA හි (පෙර ICTAD) C 4 ශ්‍රේණියේ හෝ ඊට ඉහළින් ලියාපදිංචි වී සිටිය යුතුය.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය කරන සුදුසුකම් අතර,

- පසගිය වසර 05 තුළ සිදුකළ ජල සැපයුම් සහ ජලාපවහන වැඩවල සාමාන්‍ය වාර්ෂික පරිමාව, අවම වශයෙන් රුපියල් මිලියන 38 ක් විය යුතුයි.
- පසුගිය වසර 05 තුළ, ජල සැපයුම් සහ ජලාපවාහන වැඩ වලට සමාන මේ ස්වභාවයේ සහ සංකීර්ණත්වයේ අවම වශයෙන් කොන්ත්‍රාත්තු 02 ක ඉදිකිරීම් පළපුරුද්ද. (මෙම අවශ්‍යතාවය සමග අනුකූල වීමට සඳහන් කර ඇති කාර්යයන් 70% සම්පූර්ණ වී තිබිය යුතුය)
- පත්කර ඇති තාක්ෂණික සහ කළමනාකරණ කාර්ය මණ්ඩලය, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන සුදුසුකමක් සමග වසර 03 ක මේ හා සමාන වැඩ පළපුරුද්ද සමග වසර 05 ක පළපුරුද්ද.
- ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම්වල අවම වටිනාකම අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය හැකි යම් අත්තිකාරම් ගෙවීම් හැර රු. මිලියන 5.5 ට නොඅඩු විය යුතුය.
- අත්‍යවශ්‍ය උපකරණ සතු කරගැනීම හෝ / සහ කාලෝචිත අත්පත්කර ගැනීම (අත්කරගැනීම, බද්දට ගැනීම, කුලියට ගැනීම ආදිය) ලංසු දත්ත වගන්ති 4.3 හි ලැයිස්තුගත කර ඇත.

04. අභිලාෂී ලංසුකරුවන් හට මේ පිළිබඳව වැඩිදුර විස්තර, "**අධ්‍යක්ෂ ජෙනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නො. 811/A, ජයන්තිපුර පාර, බත්තරමුල්ල**" යන ලිපිනයෙන් දුරකථන අංක 011-2888585, ෆැක්ස් 011-2883355, ඊමේල් : dg@dwc.gov.lk ඔස්සේ ලබාගත හැකි අතර, ලංසු ලේඛන පහත සඳහන් ලිපිනයේදී, 2019.12.16 දින දක්වා සතියේ දිනවල පරීක්ෂා කළ හැක.

05. ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, "**ප්‍රසම්පාදන අංශය, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - ESCAMP, ව්‍යාපෘති කළමනාකරණ, නො. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල**" යන ලිපිනයෙන් 2019.12.16 වන දින 15.00 වන පැය දක්වා, නැවත නොගෙවන රු. 14,000 ක ගාස්තුවක් මුදලින් ගෙවීම මගින් ලබාගත හැකිය.

06. ලංසු අනුපිටපත් සහිතව පහත සඳහන් ලිපිනයට 2019.12.17 වන දින පෙ.ව. 10.00 ට හෝ ඊට ප්‍රථම ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප වේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එදිනට පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

07. සෑම ලංසුවක්ම රු. 540,000.00 ක ලංසු සුරක්ෂණයක් සමග එවිය යුතුයි.

08. ලංසුකරුවන් විසින් ලංසුව සමග PCA3 ආකෘති පත්‍රය (1987 පොදු කොන්ත්‍රාත් පනත) ලබා දිය යුතුයි.

ඉහතින් සඳහන් වූ ලිපිනය,

**සභාපති,**
**ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - ESCAMP,**
**මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**නො. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
**දු.ක. 0112888426 / 0112888427**
**ෆැක්ස් : 0112888577**